**23-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, උතුම් දිව්‍යමය සේවය සඳහා ඔබ ගන්නා සියලු සිතිවිලි පවිත්‍ර සිතිවිලි වේ, එවිට ඔබ අන් සිතිවිලි වලින් නිදහස් වේ. ඒවා කිසිවිට නිෂ්ඵල සිතිවිලි නොවේ.

**ප්‍රශ්නය:** පාප ක්‍රියා (විකර්ම) වලින් ආරක්ෂා වීම සඳහා ඔබේ යුතුකම සපුරද්දී ඔබ ආකර්ෂණය නොවිය යුතු දේ මොනවාද?

**පිළිතුර:** ඔබ යහළුවන්ට සහ නෑදැයන්ට සේවය කරද්දී අලෞකික දිව්‍යමය දැක්මක් ඇතිව කිරීම වටී. ඔවුන් වෙත බැඳීමේ රැහැන් නැති විය යුතුය. පාප ක්‍රියා මත ඇතිවන සබඳකම් පිළිබඳ සිතිවිලි ඇත්නම් ක්‍රියා ද එසේම වේ. ඒ නිසා ආකර්ෂණ වලින් බැහැරව ඔබේ යුතුකම් සපුරා ඉටු කරන්න. ජීවාත්ම සිහිය තුළම හැකි තරම් සිටීමට උත්සාහ කරන්න.

ඕම් ශාන්ති. අද සුකර්ම, අකර්ම සහ විකර්ම පිළිබඳ න්‍යාය හෙවත් විකර්ම සිතිවිලිත් සාමාන්‍ය සිතිවිලි වලින් බැහැර වූ සිතිවිලි පිළිබඳ න්‍යාය විස්තර කෙරේ. ඔබ මේ ලෝකය තුළ මෙහි සිටින විට නියතයෙන්ම සිතිවිලි තිබේ. කිසිවෙකුට සිතිවිලි වලින් තොරව මොහොතක් හෝ සිටිය නොහැක. මෙහිදීත් සත් යුගයේ දීත් භක්ති මාර්ගයේ දීත් සිතිවිලි තිබෙන නමුත් ඔබ දිව්‍යමය සේවයේ උපකරණ වී ඇති නිසා සිතිවිලි සාමාන්‍ය සිතිවිලි නොවිය යුතුයි. ඒ නිසා මෙම යාගය වෙනුවෙන් ගන්නා කුමන සිතිවිල්ලක් හෝ නිකම්ම සිතිවිල්ලක් නොවේ. එනම්, ''නිර්සංකල්ප්'' හෙවත් සිතිවිලි වලින් නිදහස් බවයි. කොහොමනමුත්, කලි යුග ලෝකය ගැනත් කලි යුගයේ යහළුවන් සහ නෑදැයින් ගැනත් ඔබ ගන්නා නිෂ්ඵල සිතිවිලි සියල්ල විකර්ම සිතිවිලි වේ. ඒ මක් නිසා ද යත් ඒ සෑම නිසා සිදුවන විකර්ම වලින් ලැබෙන්නේ දුක පමණි. කොහොමනමුත්, දිව්‍යමය සේවය සහ යග්‍යාව පිළිබඳ සිතිවිලි තිබෙනා විට ඔබ නිර්සංකල්ප් (සිතිවිලි වලින් නිදහස්) යැයි කියැවේ. සේවය පිළිබඳ පවිත්‍ර සිතිවිලිම තබා ගන්න. බලන්න, බාබා ඔය දරුවන් බලාගැනීමට මෙහි සිටියි. දෙමාපියන් නියතයෙන්ම තම දරුවන් පිළිබඳ ගන්නා සිතිවිලි නම් එසේ පව් සිදුවන සිතිවිලි ලෙස ගත නොහැකිය. කොහොමනමුත්, පාපයන් මත පදනම් වූ සිතිවිලි ඇත්නම් එවිට එය පාප එකතු වීමට නියතයෙන්ම හේතු වේ. බාබා ඔබ දරුවන්ට මෙසේ කියයි ඔබ යහළුවන්ට සහ නෑදැයන්ට සේවය කරන විට අලෞකික දිව්‍යමය දැක්මක් ඇතිව කරන්න. බන්ධන රැහැන් නොතිබිය යුතුය. යුතුකම් සපුරාලිය යුත්තේ ආකර්ෂණයට ඇදී යාමෙන් තොරවයි. කොහොමනමුත්, සමහර අයට මෙහිදී කර්ම බන්ධන බිඳලිය නොහැකි නිසා ඔවුන් සත්‍යය වූ පරමාත්ම දෙවියන් අත් නොහල යුතුයි. ඔහුගේ අත ගෙන සිටීමෙන් ඔබ යම් ඉහළ ස්ථානයකට නැමෙනු ඇත. ඔබ හැම කෙනෙක්ම ඔබ තුළ ඇති පාපයන් දනී. කෙනෙකුට එක පාපයක් හෝ තිබේ නම් ඔහු නියතයෙන්ම ශරීර අවධානයෙන් යුතු කෙනෙකි. මොනයම් හෝ පාපකාරී බවක් නැති අය වූ කලී ජීවාත්ම සිහිය ඇති අයයි. කෙනෙකු තුළ පාපකාරී බවක් ඇත්නම් නියතයෙන්ම දඬුවම් පැමිණෙන අතර පාපයෙන් තොර අය දඬුවමින් නිදහස් වේ. උදාහරණ වශයෙන් ඇතැම් දරුවන් රාගයෙන්, ද්වේෂයෙන්, ආශාවන්ගෙන් හා බැඳීමෙන් තොර නිසා ඔවුන්ට ඉතා හොඳින් සේවා කළ හැකි වේ. ඔවුන් ඉතා හොඳ යෝග තත්ත්වයෙන් සහ ඥානයෙන් පිරුණු අයයි. ඔබ සියලු දෙනාම ඔහුට කැමති විය යුතුයි. මා සේම ඔබ දරුවන් දන්නවා හැම කෙනෙක්ම එවැනි හොඳ අයට ''මෙයා නම් හරි හොඳයි'' කියා පසසයි. දුර්වලකම් ඇති අයට ඊට සුදුසු සැලකීම් ලැබේ. මේ ගැන ස්ථිර ලෙස පහදා ගන්න පාප තිබෙන අයට සේවාව කළ නොහැකිය. පාප නැති අයට හොඳින් සේවය කළ හැකි වන අතර අන් අය තමා හා සමාන අය ලෙස සකස් කළ හැකි වේ. මේ නිසයි ඔබ පාපයන්ගෙන් සම්පූර්ණ ජයග්‍රහණය ලබා ගත යුත්තේ. පාප සිතිවිලි සම්පූර්ණ ලෙස ජයගත යුතුය. ඔබ පරමාත්ම දෙවියන් නාමයෙන් සත්‍ය පිළිබඳ සිතිවිලි ඇති විට ඔබ සාමාන්‍ය සිතිවිලි වලින් නිදහස් අයෙකි. ඇත්ත ම නම් ''නිර්සංකල්ප්'' තත්ත්වය යනු ඔබ කිසිඳු සිතිවිල්ලක් නැති අතර සතුටත් දුකත් අභිබවා ඇති බවයි. එය සිදුවන්නේ ඔබ සියලු කර්ම ගිණුම් පියවා සතුටිනුත් දුකිනුත් තොරව ඉහළට යන අවසාන අධියරේ දීය. ඒ වෙලාවේදී ඔබට කිසිඳු සිතිවිල්ලක් නොතිබේ. එම අවස්ථාවේදී ඔබ සුකර්ම හා අකර්මත් අභිබැවූ තත්ත්වයක සිටී. මෙහිදී ඔබට නියතයෙන්ම සිතිවිලි තිබිය යුතුය. ඔබ මුළු ලොවම පවිත්‍ර කරන උපකරණ බවට පත් වී ඇති නිසයි. ඉතින් ඒ ගැන ඔබට පිරිසිදු සිතිවිලි ඇත. සත් යුගයේ දී ඔබට පිරිසිඳු සිතිවිලි ඇති නිසා ඒවා සිතිවිලි නොවේ, ක්‍රියා වල යෙදීමේ දී ඔබ කර්ම බන්ධන ඇති නොකර ගනී. ඔබට වැටහී ගියා ද? මෙසේ කර්ම න්‍යාය ගැන සුකර්ම, අකර්ම හා විකර්ම වශයෙන් තේරුම් කළ හැක්කේ පරමාත්ම දෙවියන්ට පමණි. අපව පාපයෙන් නිදහස් කළ හැක්කේ ඔහුට පමණක් වන අතර ඔහු අපට උගන්වන්නේ සංගම් යුගයේ

දී ය. දරුවනි, ඒ නිසා ඔබ ඔබ ගැන මනා අවධානයෙන් සිටින්න. ඔබේ කර්ම ගිණුම් පිළිබඳව දිගටම නිරීක්ෂණය කරන්න. ඔබ මෙහි පැමිණියේ කර්ම ගිණුම් පියවා ගැනීමටයි. ඔබ මෙහි පැමිණ ද තවත් කර්ම ගිණුම් සාදා ගනිමින් දඬුවමට ලක්වීම නොකර ගත යුතුයි. දරුගැබ නම් වූ සිර ගෙය තුළ ලබන දඬුවම ද සුළු නැත. ඒ නිසා ඔබ බොහෝ උත්සාහවන්ත විය යුතුයි. අවසානය ඉතා ඉහළ නිසා ප්‍රවේසමින් යා යුතුයි. ඔබ නියතයෙන් ම පාපකාරී සිතිවිලි ජය ගත යුතුයි. ඔබ එය කොතෙක් දුර කර තිබේ ද? ඔබ කොතෙක් දුරට සිතිවිලි වලින් මිදී සිටී ද? හෙවත් සතුටත් දුකත් අභිබැවූ තත්ත්වයට කොතෙක් දුරට පත්ව තිබේ ද? මෙය ඔබටම දැන ගත ගත හැකිය. එසේ දැන ගත නොහැකි අයට බාබාගෙන් සහ මමා ගෙන් අසා දැන ගත හැකිය. මක් නිසා ද යත් ඔබ ඔවුන්ගේ උරුම කරුවන් නිසා ඔවුන්ට එය කිව හැකිය. සාමාන්‍ය සිතිවිල්ලෙන් ඔබ මිදී සිටීමේ අවස්ථාව සමඟ ඔබට ඔබේ පාප සිතිවිල්ලෙන් මිදීම පමණක් නොව තවත් පාපකාරී කෙනෙකුගේ පාප ද වැලැක්විය හැකි වන අතර ඔබ ඉදිරියට එන කාම රාගයෙන් යුතු කෙනෙක් එම පාපකාරී සිතිවිල්ලෙන් මිදෙනු ඇත. මිනිසුන් දෙවි දේවතාවුන්ගේ ප්‍රතිමා ඉදිරියට ගිය විට පවා ඔවුන් සාමයට පත් වේ. ඒ ආකාරයෙන් ම ඔබ ද අප්‍රකට ස්වරූපයකින් දෙවි දේවතාවුන් වේ. පාපකාරී සිතිවිලි ඇති කිසිවෙකුට ඔබ ඉදිරියට ආ නොහැකිය, ඔබ යෝගී යුක්තව සිටින විට රාගාධික කෙනෙකුට වුවද ඔබට හානියක් කළ නොහැකිය. බලන්න ඔබ දරුවන් පරම සත්‍ය වූ පරමාත්ම දෙවියන් ඉදිරියේ මෙහි පැමිණ සිටින්නේ සියලු පාප ඔහු වෙත බාර දීමටයි. නමුත් ඔබ සමහර අය මෙම දීම නිරවද්‍යවම කර නැත. ඔවුන්ගේ යෝගාව පරමාත්ම දෙවියන්ට සම්බන්ධ නොවේ. දවස පුරාම ඔවුන්ගේ බුද්ධිය යෝගා නොවී එහෙ මෙහෙ සැරිසරන අතර ඔවුන් ජීවාත්ම විඤ්ඤාණය තුළ ද නැත. ඔවුන් ශරීර අවධානයෙන් සිටින නිසා අන් අයගේ ස්වභාවයේ බලපෑම ඔවුන්ට ලැබී දෙවියන් වෙත තිබිය යුතු සෙනෙහසේ වගකීම ඉටු කිරීමට ඔවුන් අපොහොසත්ය. එනම්, ඔවුන්ට පරමාත්ම දෙවියන්ගේ සේවය කිරීමට අයිතිය ඉල්ලිය නොහැක. පරමාත්ම පියා ගේ සේවය ලබා ගෙන අන් අයට සේවය කරන අන් අය අපිරිසිඳු බවින් පිරිසිඳු බවට පත් කරවන දරුවන් ඔහුගේ සත්‍ය යථාවාදී දරුවන් වේ. ඔවුන් ඉතා ඉහළ මට්ටමකට නැංවේ. දැන් දෙවියන් ඔහු විසින් ම පැමිණ පියා බවට පත් වී ඇත. පියා හරි හැටි හඳුනා නොගෙන ඔබට වෙනත් වර්ගයේ සිතිවිලි ඇති වනවා යනු විනාශය කරා තල්ලු වීමයි. දැන් ඥාන ගංගා 108 ක් ඔවුන්ගේ පූර්ණත්ව තත්ත්වයට පැමිණෙන වේලාව උදා වී තිබෙන නමුත් හරි හැටි අධ්‍යයනය නොකළ අය විනාශ වී යයි. මෙය හරියට ම තදින් තේරුම් ගන්න ජනී ජනන්හර් යන හැම කෙනෙක් ගැනම දන්නා බාබා මෙම යාගය තුළ වැරදි ක්‍රියා රහසේ කරන අය දෙස බලා ගෙන සිටී. එවිට ඔහු සකාර් හෙවත් ශාරීරික ස්වරූපයේ සිටින බ්‍රහ්ම බාබා මඟින් අනතුරු ඇඟවීම සඳහා ක්‍රියා කරයි. ඒ නිසා ඔබ කිසිවක් නොසැඟවිය යුතුය. වරදක් සිදු වුවද ඔහුට එය නොවලහා කීම මඟින් අනාගත ආරක්ෂාවක් ඇති වේ. ඒ නිසා දරුවනි ප්‍රවේසම් වන්න. දරුවනි, පළමුව ම ඔබ ඔබ ම හඳුනා ගන්න මම කවු ද? මම කුමක් කරන කෙනෙක් ද? මම යනුවෙන් කියැවුණත් මෙහි දී එය ශරීරයට අදාල නොවන අතර ඒ ජීවාත්මයයි. ජීවාත්මය වන මම පැමිණියේ කොහි සිට ද? මම කාගේ දරුවා වෙම් ද? ජීවාත්මය වශයෙන් මා පරමාත්ම පියා වන පරමාත්ම ජීවයේ දරුවා ලෙස දන්නා කළ පියා සිහි කිරීමෙන් මහත් සතුටක් ඇති වේ. දරුවන් පියාගේ කාර්යය දැනගත් විට මහත් සතුටක් අත් විඳී. කුඩා කල දරුවෙක් පියාගේ කාර්යය නොදන්නා විට එතරම් සතුටක් නැත. ළමයා වැඩෙන විට පියා ගේ කාර්යය දැනුවත් වී කුල්මත්භාවය සහ සතුට වැඩි වේ. ඉතින් පළමුවෙන් ම බාබා කවු ද? ඔහු ජීවත් වන්නේ කොහි ද? සහ ඔහුගේ කාර්යය දැනුවත් වන්න. ජීවාත්මය ඔහු තුළට කිඳාබැසී යැයි කී කල ඉන් හැඟී යන්නේ ජීවාත්මය විනාශ වන බවයි. එවිට සතුටක් ඇති වෙයි ද? ඔබ වෙත එන ශිෂ්‍යයන් ගෙන් මෙසේ ඇසිය යුතුයි ඔබ මෙහි දී ඉගෙන ගන්නේ මොනවා ද? ඉන් ඔබට ලැබෙන තත්ත්වය කුමක් ද? ලෞකික වශයෙන් විද්‍යාපීඨ වල ඉගෙන ගන්නා අයගෙන් ඇසුව විට ඔවුන් කියන්නේ වෛද්‍යවරයෙක් හෝ ඉන්ජිනේරුවෙක් ලෙස පත් වන බවයි. එවිට ඔබ දන්නවා ඔවුන් ඒවා ඉගෙන ගන්නා බව. මෙහිදී ද ළමුන් කියා සිටින්නේ මේ ලෝකය දුක් සහිත බවත් අපාය වැනි බවත් යක්ෂ ලෝකයක් බවත් ය. ඊට ප්‍රති පක්ෂව දිව්‍යලෝකය හෙවත් දේවි දේවතාවුන් සිටින ලෝකය ඇත. මෙය දිව්‍යලෝකය නොවන බව කවුරුත් දනී. මෙය වූ කලී අපාය වූ දුක් සහිත ලෝකයයි. මෙය පාපකාරීන්ගේ ලෝකය නිසා දරුවන් ඔහුට අඬගසා කියන්නේ අපව පුණ්‍යවන්ත ලෝකයකට රැගෙන යන ලෙසයි. මෙහි ඉගෙන ගන්නා දරුවන් දන්නවා බාබා ඔවුන් එම ලෝකයට ගෙන යමින් සිටින බව. අළුතින් මෙහි එන සිසුන්ගෙන් අසා දැන ගත යුතුයි. ඔවුන් දරුවන්ගෙන්ම ඉගෙන ගත යුතුයි. ඔවුන්ට කිව හැකියි පියාගේ හා ගුරුවරයාගේ කාර්යය කුමක් ද කියා. පියා ම ඔහුගේ වර්ණනාව කර නොගනී. ගුරුවරු ද එසේ නොකරයි. ඒ ගැන කියා දෙන්නේ ළමුන් ය. මෙසේ කියැවෙන්නේ ඒ නිසාය සිසුන්ගෙන් ගුරුවරයා කොහොම කෙනෙක් දැයි දැන ගත හැකිය. ඔබ මේ පාඨමාලාව හැදෑරූ දරුවන් නිසා අළුත් අයට කියා දීම ඔබේ යුතුකමයි. උපාධි වලට උගන්වන ගුරුවරුන්

අයනු ආයනු උගන්වයි ද? ඇතැම් සිසුන් ඉතා දක්ෂ ලෙස අන් අයට උගන්වයි. එසේ ඉගැන්වීමේ සිහිවටනය වන්නේ ගුරු මාතාවයි. එනම්, දෙවි දේවතා ධර්මයේ පළමු මාතාව වන ජගදම්බා වේ. මව පිළිබඳ විශාල පැසසුම් ඇත. බෙංගාලයේ කාලි, දූර්ගා, සරස්වතී සහ ලක්ෂ්මී බොහෝ සෙයින් වන්දනාවට ලක්වේ. කෙනෙක් ඔවුන්ගේ ක්‍රියා දැන ගත යුතුයි. උදාහරණ වශයෙන් ලක්ෂ්මී වූ කලී ධනයේ දෙවඟනයි. ඇය මෙහි පාලිකාව වී සිටියේ ය. කොහොමනමුත්, ඇයට කාලි, දූර්ගා ආදී නම් ද පටබැඳී ඇත. මව්වරු හතරක් සිටියා නම් (දෙවඟනන්) දෙවි වරු ද හතරක් සිටිය යුතුයි. නාරායන් වූ කලී ලක්ෂ්මී දෙවඟනගේ බව කවුරුත් දනී. කාලී හා සම්බන්ධ කවුද? (ශංකර්). කොහොමනමුත්, ශංකර්ව හඳුන්වා ඇත්තේ පාර්වතී ගේ සැමියා ලෙසයි. පාර්වතී යනු කාලි නොවේ. බොහෝ අය කාලීට වන්දනා කරයි. ඔවුන් ඇයගේ සැමියා නොදනී. කාලීට සැමියා හෝ පියා හෝ සිටිය යුතු වුවත් කිසිවෙක් ඒ ගැන නොදනී. ඔබ තේරුම් කර දිය යුත්තේ එකම එක ලෝකය මෙය පමණක් බවත් යම් කාල සීමාවක දී එය දුකින් පිරි අපාය වන බවත් එම ලෝකයම පාරාදීසය බවට පත් වී සත් යුගයේ දිව්‍යලෝකය වන බවත් ය. සත් යුගයේ දී මෙම ලෝකය පාලනය කළේ ලක්ෂ්මී සහ නාරායන්ය. සූක්ෂම කලාපයේ ලක්ෂ්මී සහ නාරායන් ගේ සූක්ෂම ස්වරූප සහිත දෙව් ලොවක් නැත. ඔවුන්ගේ ප්‍රතිමා ඇත්තේ මෙහි වන අතර ඔවුන්ගේ පාලනය තිබී අවසන් කළේ ද මෙහිය. මුළු නාටකයම සිදුවන්නේ ශාරීරික භෞතික ලෝකය තුළය. මේ භෞතික ලෝකය පිළිබඳ ඉතිහාසය සහ භූගෝලයක් ඇත. සූක්ෂම කලාපයේ ඉතිහාසයක් හෝ භූගෝලයක් නැත. කොහොමනමුත්, ඒ හැමෙකක්ම පසෙක තබා නව ශිෂ්‍යයින්ට ඇල්ෆා බීටා ඉගැන්විය යුතුය. ඇල්ෆා යනු පරමාත්ම දෙවියන් ය, ඔහු පරමාත්ම ජීවයයි. මෙය සම්පූර්ණයෙන්ම තේරුම් ගන්නා තෙක් ඔවුන්ට දෙවියන් පිළිබඳ සෙනෙහස ඇති නොවන අතර පළමු වෙන්ම දෙවියන් සහ ඔහුගේ කාර්යය දැනුවත් වීම නිසා සතුට ඇති වේ. මෙම පළමු කරුණ තේරුම් ගැනීම නිසා සතුටක් ඇති වේ. පරමාත්ම දෙවියන් සදාතනික ලෙස සතුටින් හා ප්‍රමෝදයෙන් යුතු වෙයි. අප ඔහුගේ දරුවන් නිසා අපට ඒ සතුට නොතිබෙන්නේ ඇයි? උතුරා යන සතුටු හැඟීම් නැත්තේ ඇයි? මා දෙවියන්ගේ දරුවා වන අතර සදා සතුටින් යුතු දේව දරුවාය. සතුට නැත්නම් ඉන් හැඟෙන්නේ ඔබ දෙවියන්ගේ දරුවා සේ නොසලකන බවයි. පියා සදා සතුටින් යුතු වුවත් මා සතුටින් නැත්තේ මා පරමාත්ම පියාව නොදන්නා නිසාය. එය ඉතා සරළ කරුණකි. සමහර අය මේ ඥානයට කන් දෙනවා වෙනුවට සාමයෙන් සිටීම තෝරා ගනියි. මක් නිසා ද ඔවුන්ට මේ ඥානය ලැබීමේ හැකියාව නොමැති නිසයි. දැන් ඒ තරම් ලොකු කාලයක් ද නැත. ඔවුන් ඇල්ෆා ගැන පමණක් දැන නිහඬව සිටියා නම් එය ද හොඳය. සන්‍යාසිවරු ද කඳු මුදුන් වල ගුහා වල හිඳ දෙවියන් සිහි කරයි. එසේම ඔබ පරමාලෝකය ද පරමාත්ම පියා ද වන පරමාත්ම ජීවය සිහිකිරීම වටී. සන්‍යාසිවරු ද පාපයෙන් තොරව සිටින්නේ දෙවියන් සිහිකිරීම තුළිනි. ඔවුන්ට ගෙවල් වල සිට එසේ කළ නොහැක. ඔවුන්ගේ දරුවන්ට ඇති ඇලීමෙන් ඔවුන් ඇදී යයි. එමනිසා, ඔවුන් සියලු දේ අතහැර යයි. ඔවුන් එසේ ශුද්ධවන්ත වී සතුට ලබයි. එවැනි සන්‍යාසීන් ඉතා හොඳය. මුල් දෙවියා ද සන්‍යාසි කෙනෙක් වුණා නේද? දිල්වාලා කෝවිල ඉදිරිපිට අනිත් පැත්තේ ආදි දේව් තපස්යා කරමින් සිටිනා පෙන්වන සිද්ධස්ථානයක් ඇත. ගීතාවේ ද මෙසේ කියා ඇත සියලු ශරීර හා සම්බන්ධ ආගම් අතහරින්න. සියල්ල අතහැර යාමෙන් මිනිසුන් මහත්මාවරුන් බවට පත් වේ. ගෘහස්ථ කෙනෙකුට මහාත්ම කෙනෙක් යැයි කීම වැරදිය. පරමාත්ම දෙවියන් පැමිණ ඔබව අතහැරීමට යොමු කරවයි. අතහැරීමෙන් සතුට ලැබේ. මහාත්ම ජීවාත්මයන්ට අසතුටින් සිටීම කොහෙත් ම නොසිදු වේ. සමහර රජවරු ද ඔටුන්නත් සියලු දේත් අතහරී. ගෝපිචන්ද රජු සියල්ල අතහැරි අයෙකි. ඒ නිසා එහි නියත වශයෙන්ම සතුට ඇති බව පෙනේ. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. රහසේ වැරදි ක්‍රියා සිදු නොකරන්න. බාප්දාදා ගෙන් කිසිවක් නොසඟවන්න. බොහෝ සෙයින් ප්‍රවේසම් වන්න.
2. ශිෂ්‍යයා, ගුරුතුමාව පෙන්වයි. ඔබ ඉගෙනගත් දේ අන් අයට ද උගන්වන්න. ඔබ සදා සතුටින් යුතු පරමාත්ම දෙවියන් ගේ දරුවන්ය. මෙම සිහිපත්භාවය ඇතිව අසීමිත සතුටින් සිටින්න.

**වරදානය:** පාප සර්පයා ඔබේ යහන කර ගැනීමෙන් ඔබ විෂ්ණු මෙන් නිරන්තරව ජයග්‍රාහී සහ සැහැල්ලු

වේවා.

සර්පයන්ගේ යහනක නිරූපණය කර ඇති විෂ්ණු, ඔබ ජයග්‍රාහී දරුවන්ගේ පහසු යෝගී ජීවිතයේ සිහිවටනයකි. පාප වල සර්පයා පවා යෝගාව තුළින් පහසුවෙන් පාලනය කළ හැකිය. පාප වල සර්පයාට එරෙහිව ජයග්‍රහණය ලබා එය සුව පහසුව ඇති යහනක් බවට පත් කරවන දරුවන් විෂ්ණු මෙන් නිරන්තරව සතුටින් හා සැහැල්ලුවෙන් සිටිති. එබැවින්, පාප පාලනය කළ සහ ඔබ ඉදිරියේ සියලු අයිතීන් ඇති ජීවාත්මයක් යන මෙම ප්‍රතිරූපය නිරන්තරව තබා ගන්න. ජීවාත්මයක් වන ඔබ නිරන්තර විවේක තත්ත්වයක සිටින අතර සැහැල්ලුවෙන් සිටී.

**පාඨය:** දරුවෙකු සහ පාලකයෙකු වීමේ සමබරතාවය තුළින්, ඔබේ සැළසුම් ප්‍රායෝගික ස්වරූපයකට දමන්න.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

ඔබේ සෑම භෞතික ඉන්ද්‍රියකටම ඔබේ බලය සංඥා කරන්න, එවිට ඔබට එවැනි සංඥා සමඟ ඒවා ඔබට අවශ්‍ය පරිදි චලනය කිරීමට හැකි වනු ඇත. මේ ආකාරයෙන් භෞතික ඉන්ද්‍රියන් ජය ගන්නෙකු වන්න, එවිට ඔබට පදාර්ථ ජය ගන්නෙකු වීමටත්, කර්මතීත් අවධියේ අසුන් ගැනීමටත් ලෝක රාජධානියේ පාලකයෙකු වීමටත් හැකි වනු ඇත. ඔබේ සෑම භෞතික ඉන්ද්‍රියක්ම "ඔව් මගේ ස්වාමීනි", "සිටිනවා, මගේ ස්වාමීනි" කියමින් දිගටම ක්‍රියාත්මක විය යුතුය. ඔබේ භෞතික ඉන්ද්‍රියන් නිරන්තරව ඔබව රාජකීය පාලකයෙක් ලෙස පිළිගන්නා විට, එනම්, ඔවුන් ඔබට ආචාර කරන විට, එවිට ඔබට කර්මතීත් වීමට හැකි වනු ඇත.